# මා දුටු සිරිල්

**ජේ.ටී.විජේරත්න**



## සිරිල් යනු කවුද?

සිරිල් යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මනුෂ්‍යයෙකි. මට හමුවූ අමුතුම ආකාරයේ මනුෂ්‍යයෙකි. මට ඔහු මුනගැසුනේ තරුණ වියේදී වුවද, ඔහුගෙන් අසන්නට ලැබුනු පාසැල් අවදියේ සිද්ධීන් අතරින් එකක් දෙකක් මගේ මතකයට නැගෙයි.

ඔහුගේ ආකල්පය වූයේ ඉගෙනගන්නේ දැනුම වැඩිදියුණු කරගැනීමට විනා සහතිකපත් එකතුකරගැනීමට නොවේය යන්නයි. එබැවින් කුඩාකල සිටම ඔහු නොයෙක් විෂයයන් ඔස්සේ තම දැණුම වැඩිකරගනු ලැබීය. අපොස(සාපෙ) විභාගයට පෙනීසිටීම පවා ඔහු ප්‍රතික්ෂේප කරන ලදී.

මේවනවිට ඔහු ලබා තිබූ ඉලෙක්ට්‍රොනික විද්‍යා දැනුම සහ වෙනත් කාර්මික විශය දැනුමද සැලකියයුතු උසස් මට්ටමක පැවතින. පාසැල හැරගිය පසු වෘත්තීය වශයෙන් ඔරලෝසු අළුත්වැඩියාව තෝරාගෙන තම නිවසේ සිටම එම කාර්යයේ නිරත විය.

මේ අතරතුර නොයෙක් ඉලෙක්ට්‍රොනික පර්යේශණ වල නිරතවිය. ලංකාවෙහි පරිඝනක නොතිබූ එකල (1970 දී පමණ) කුඩා පරිඝණක උපාංග ආනයනය කර පරිඝණකයක් එකලස් කරන ලදී. (SINCLAIR – 1kb) “සින්ක්ලෙයාර් බේසික්” නමැති පරිඝනක භාෂාව අනුව නොයෙක් මෘදුකාංග පිළියෙල කිරීමද විනෝදාංශයක් විය. එය උපයෝගි කරගනිමින් නොයෙක් ස්වයංක්‍රිය උපකරණ නිපදවීමත් විනෝදාංශ අතරට එක්වුවද ඒවා රුපියල් ශත බවට පරිවර්තනය කිරීමට උනන්දුවක් නොවීය.

**ජ්‍යෝතිෂය**

මේ අතරතුර ඔහුගේ මනස මුළුමනින්ම වෙනස් මගකටද යොමුවිය. ඒ ජ්‍යෝතිෂයයි. ජ්‍යෝතිෂයෙහි ඇති ක්‍රිෂ්ණමූර්ති පද්ධතිය හදාරමින්

නොයෙකුත් අනාවැකි පළකරන්නටවිය. දිනක් මා දුරකථනයෙන් කථාකරනවිට විදුලිය බිඳවැටීමක් පවතිනබව මා පැවසූවිට, මිනිත්තු දෙකක් පමණ ගතකර යම් ගණනය කිරීමක් කර නැවත විදුලිය යථා තත්වයට පැමිණෙන වේලාව පවසන ලදී. මිනිත්තුවකවත් වෙනසක් නොවී එකී වේලාවටම නැවත විදුලිය ලැබුනි. තවත් දිනක කොළඹ මාළිගාකන්දේ ඇති විහාරස්ථානයක ජ්‍යොතිෂය පිළිබඳ දේශනයක් පැවැත්වෙන බව පවසා මටද එහි පැමිණෙන ලෙස දැන්වූ අතර එහිදී මා හමුවූ වහාම ඔහුගේ සාක්කුවෙන් ගත් කඩදාසියක් මාඅත තැබීය. එය දිගහැර පිරික්සූවිට මා දුටුවේ යම් ගණනය කිරීමක් කර අවසානයේ මා හමුවන වේලාව සටහන් කරඇති බවයි. වහාම මාගේ දෙනෙත් යොමු වූයේ ඔරලෝසුව වෙතය. එම වේලාව නිවැරදිව සටහන්ව තිබුනි.

**පොල් හොරුන්ට හොල්මන් පෙන්වීම**

ඔහුට පොල් ඉඩමක් හිමිව තිබූ අතර පොල් ගබඩාකර තිබුනේ නිවසට තරමක් දුරින් පිහිටි පොල් අතු මඩුවකය. නිතරම වාගේ පොල් හොරකම් කරන බව දැනුන පසු ඔහු උපායක් යෙදීය. ඒ සඳහා සයිරන හඬක් නිකුත් කරන ඉලෙක්ට්‍රොනික උපකරණයක් මඩුවතුල සඟවා තිබූ අතර එහි වහලය මුදුන මත විශේෂ ක්‍රමයකට අටවනලද හිස් මුට්ටි දෙකක්ද විය. හොරා මඩුවට ඇතුළුවන විටම ඒවා ස්වයංක්‍රිය ලෙස ක්‍රියාත්මක විය. සයිරන හඬත් සමගම මුට්ටි දෙක වහලය දිගේ දෙපැත්තට පෙරලී ගොස් බිමවැටී ශබ්ද නගා කුඩුවිය. හොල්මනක් යයි බියවූ හොරා පණ එපා කියා දුවන්නට වුවද වැඩිදුර නොගොස් සිහිසන්ව ඇදවැටුනි. හොරාව සුවපත් කිරීමද සිරිල්ටම පැවරුන අතර හොල්මන් කථාව ගමපුරාම ලැව්ගින්නක් මෙන් පැතිරුන බැවින් හොරකම් සියල්ල එයින්ම නතරවිය.

**අපවිත්‍ර පූජා වට්ටිය**

බෞද්ධයෙකු වූ සිරිල් බුදුදහම කෙරෙහි අචල පැහැදීමක් තිබුනද, අපරිමිත ශ්‍රද්ධාවක් නොවීය. ඔහු දේව ඇදහිලි තරයේ ප්‍රතික්ෂේප



කළේය. දිනක් දෙවියන් කෙරෙහි අන්ධ භක්තියක් පැවති හිතවතෙකු සමග හටගත් විවාදයක් කෙළවර වූයේ කතරගම දෙවියන්ට කරනලද අභියෝගයකිනි. තම අභියෝගය වූයේ අපවිත්‍ර පූජාවට්ටියක් කතරගම දේවාලයට පූජාකිරීමයි. ඒ අනුව දෙදෙනාම කතරගම ගියහ. පූජාවට්ටියක් සූදනම්කර ඊට මළ සහ මුත්‍ර ස්වල්පයක්ද එකතුකර අනෙක් බැතිමතුන් සමගම දෙදෙනාම දේවාලයතුලට ගිය අතර, සිරිල් තම දෑතින්ම එය කපුවා වෙත ප්‍රදනය කරන ලදී. නමුත් ඉන් කිසිම අයුරක අනිසි ප්‍රථිඵලයක් සිදුනොවීය.

**ආධුනික ගුවන් විදුලි ශිල්පය**

වර්ෂ 1973 දී පමණ මම ශ්‍රී ලංකා ආධුනික ගුවන්විදුලි සංගමයේ (Radio Society of Sri Lanka) සාමාජිකත්වය ලබාගතිමි. සිරිල්ද එම සංගමයේ සාමාජිකයෙක්වූ බැවින් මට ඔහුව හඳුනා ගන්නට ලැබුනේ මෙම වකවානුවේදීය. ආධුනික ගුවන්විදුලිය පිළිබඳව රජයෙන් පවත්වනුලබන විභාගයෙන් සමත්වූ ඔහු ඊට අදල මෝස් පරීක්ෂණයෙන්ද සමත්ව, ආධුනික ගුවන්විදුලි සම්ප්‍රේශණ බලපත්‍රයක් හිමි කරගත් අතර තමා විසින්ම සාදගත් ගුවන්විදුලි සම්ප්‍රේශකය භාවිතයෙන් ලොවපුරා වෙසෙන ආධුනික ගුවන්විදුලි ශිල්පීන් සමග සන්නිවේදනය කරන්නට යෙදුනි. බොහෝ දිනවල මැදියම්රැය පසුවනතුරුත් ආධුනික ගුවන්විදුලිය ඔස්සේ අප කතාබහ කරන්නට පුරුදුව සිටියෙමු.

**ටෙලි සිනමාව**

ලංකාවට රූපවාහිනිය පැමිණි මුල් අවදියේදී වීඩියෝ කැමරාවක් මිළට ගත් ඔහු නව විනෝදාංශයක හිමිකරුවෙක්විය. හුදු විනෝදාංශයකට සීමා නොකර වඩාත් ඵලදයී ලෙස එම උපකරණ භාවිත කිරීමට අදහසක් පහළවිය. රූපවාහිණියෙන් විකාශණය කිරීම සඳහා සිනමාවක් හෙවත් ටෙලිනාට්‍යයක් නිශ්පාදනය කිරීම ඔහුගේ අරමුනවිය. පැරණි ජනකථාවක් තෝරාගෙන අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලදී. මේ අනුව වයඹ පළාතේ කොබෙයිගනේ

නමැති පිටිසර ගම්මානයක් ඒ සඳහා තෝරාගන්නා ලදී. ඇල දෙල වැව් පොකුණු සහ විශාල කුඹුරුයායන් සහිත මනස්කාන්ත පරිසරයකින් හෙබි එම ප්‍රදේශයට ගිය අපි සතියක් පමණ පාසැලක නවාතැන් ගෙන රූගතකිරීම් වල නිරත වීමු. නළුනිලියන් සියල්ලෝම නවකයන් වුවද එය සෑහෙන උසස් තත්වයක පැවතුනි. එම ගමෙහි ආරච්චි මහත්තය සහ තවත් ප්‍රභූන් කීපදෙනෙක්ද ඊට සහභාගි විය.
බලාපොරොත්තු නොවූ ප්‍රශ්ණයක් පැනනැගීමෙන් සිරිල්ගේ පවුල් සංස්ථාව දෙදරා යාම හේතුකොටගෙන එම සිනමාවෙහි සංස්කරන කටයුතු අතරමග නතරවිය.

## දුශ්ටයෙකුගේ සංක්‍රමනය

සිරිල්ගේ අසල්වැසි හිතවතෙක් සෑමවිටකම ඉතා ළඟින් ඇසුරු කරන්නටවිය. ඔහු ඇන්තනි ලෙස හඳුන්වමු. ඔහු ආධුනික ගුවන්විදුලිය පිළිබඳ උනන්දුවක් දක්වන්නට වූයෙන් සිරිල් කිසිම පැකිලීමක් නොමැතිව තමා දන්නා සියල්ලම ඔහුට ඉගැන්වීය. මේවනවිට සිරිල් අගනුවර පිහිටි ඉලෙක්ට්‍රොනික ආයතනයක සේවය කළෙන් දිනපතාම හිමිදිරි උදෑසන ගෙදරින් පිටත්ව ආපසු නිවසට පැමිණෙන්නේ අඳුර වැටුන පසුවය. බොහෝ දිනවල රාත්‍රිකාලයේ පැය කීපයක්ම ඇන්තනිද, සිරිල්ගේ නිවසේ කාලය ගතකරන්නටවිය.
වැඩිකල් නොගොස්ම සිරිල්ගේ බිරිය වූ සිරිමා සහ ඇන්තනී අතර අනියම් සබඳතාවක් ගොඩනැගෙන්නට විය. සිරිමා උපායශීලීව ලාබාලවියේ වියේ පසුවන තම දරු තිදෙන පියා කෙරෙහි බිඳවීය. එපමණක් නොව තම අනියම් සබඳතාවද සාධාරනීකරනය කිරීමට ඇය සමත්විය. එපමණක්ද නොව තම පියා රැකියාවට යනබවට බොරු කියමින් වෙනත් කාන්තාවන් ඇසුරු කරමින් කල් ගෙවන බවට බොරු කතා ගොතමින් ඉතා සූක්ෂම ලෙස දරුවන්ගේ සිත් දූශනය කරවීය. එතෙකින් නොනැවතුන ඇය සිරිල්ගේ මවගේ සිතටද විශ පෙවීය.



## දුරස්ථ පාලක වීඩියෝ

ඇය සිදුකළ විනාශය සිරිල්ට අවබෝධවූයේ ඉන් පසුවය. මේ පිළිබඳව කල්පනාකළ ඔහු උපායක් යෙදීය. තම වීඩියෝ කැමරාව ඇඳ දෙසට යොමුකර වීදුරු අල්මාරිය තුල සවිකර දුරස්ථ පාලක පරිපථයක් සම්බන්ධකර, රැකියාවට යනබව පවසා තම යතුරුපැදියෙහි නැගී අසල ඇති කඳුගැටයක් මුදුනට ගොස් දෙනෙතිය (binocular) මගින් තම නිවස අසල පරිසරය පිරික්සන්නටවිය. ටික වේලාවකට පසු ඇන්තනි තම නිවස දෙසට යන බව පෙනුනි. ඔහු ගෙතුලට ගියපසු දුරස්ථ පාලකය මගින් කැමරාව ක්‍රියාත්මක කරවිය. ආපසු නිවසට පැමිණ පරීක්ෂා කළවිට දක්නට ලැබුනේ බලාපෙරොත්තු වූවාටත් වඩා හොඳින් සියල්ල සටහන්වී ඇති ආකාරයයි. තවත් වීඩියෝ පටි දෙකකටද එය පිටපත්කර ආරක්ෂිතව තබා, ඊළඟට කළේ, තමා දෙස වපර ඇසින් බලන තම මවට එය නැරඹීමට සැලැස්වීමයි.

## පවුල් හුවමාරුව

මේබව දැනගත් ඇන්තනී මාරාවේශවිය. ඔහු කළේ තම භාර්යාව වන මේරිට පහරදී ගෙදරින් එලවා දැමීමයි. ඇය හඬා වැලපෙමින් සිරිල් වෙත පැමිණිවිට සිරිමා කළේ අතට හසුවන දේවල් වලින් දෙදෙනාටම පහරදීමයි. මේ අතරතුර සිරිල්ගේ දියණියක් ඔහුගේ අත සපාකෑ කැලල මාස ගණනකට පසුවද නොමැකී පැවතුනි. වෙන කළහැකි දෙයක් නොවූයෙන් සිරිල්, මේරිත් සමග පිටවිය. මේ අනුව පවුල් හුවමාරුවක් සිදුවිය. මේරිට දරුවන් නොසිටි බැවින් ප්‍රශ්ණය එතරම් සංකීර්ණ නොවීය.
සිරිල් සහ මේරි වෙනත් ප්‍රදේශයකට ගොස් නිවසක් කුලියට ගෙන වාසය කළෝය. සිරිල්ගේ ගෙදර තිබූ රුපියල් ලක්ෂ ගණනක් වටිනා ඉලෙක්ට්‍රොනික උපකරණ සියල්ල ඔහුට අහිමි විය.

## කනකොකා හැඬීම

ඇන්තනිද සිරිල්ගේ නිවසෙහි දින කීපයක් සිරිමා සමග ගතකළ නමුත් ස්ථිර පදිංචියට ආවේ නැත. දරු තිදෙනෙකුගේද වගකීම තමාට පැවරෙන බව පෙනුනෙන් එය භාරගැනීමට ඔහු සූදනම්වූයේ නැත. දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු අඩාලවූ නමුත් සිරිල් වරින්වර ඔවුන්ගේ වියහියදම් දැරීය. මේ අතර වැඩිමහල් දියණිය ශ්‍රියානි වෛද්‍ය විද්‍යාලයට ඇතුල්වූ අතර බාල දියණිය පියුමි ඇගේ පෙම්වතා සමග විවාහවිය.

## සිරිමාගේ වියෝව

වසර කීපයකට පසු පිලිකා රෝගයක් වැළඳුන සිරිමා මහරගම පිළිකා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි අතර සිරිල් සමග මමද එහි ගියෙමි. දියණිය වෛද්‍ය ශිෂ්‍යාවක් වූ බැවින් ඇය කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු වුවද සැමටම හිමි අනිත්‍යභාවය ඉස්මතුවිය. වැඩි දිනක් නොගොස් ඇයගේ අභාවයට සිදුවිය. ඔවුන්ගේ නිවසේ වූ අවමංගල උත්සවයට සිරිල්ද සහභාගීවුවත් ඔහු සිටියේද අමුත්තෙකු ලෙසිනි.

## සිරිල්ගේ දුම්වැටිය

සිරිල්ගේ එක් දුර්වලතාවයක් වනුයේ කිසිවිටකත් තම වරද පිළි නොගැනීමයි. නැතහොත් අනුන්ගේ අදහස්වලට ඇහුම්කන් නොදීම ලෙසද දැක්විය හැකිය. එවැනි අවස්ථා කීපයක් මට මතකය.

එවැනි එක් අවස්ථාවක් මෙසේ දැක්විය හැකිය. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංගමයේ සාමාජිකයෙකුට අයත් ගොඩනැගිල්ලක ඉහළම මාලයේ කාමරයක් සංගමයේ වැඩකටයුතු සඳහා ප්‍රදනය කර තිබුනි. දිනක් මා විසින් එහි සාමාජිකයින් සඳහා පන්තියක් පවත්වන අතරතුර එහි පැමිණි සිරිල් ටිකවේලාවක් ඉන් පිටතට එළිමහන් පෙදෙසට ගොස් දුම්වැටියක් දල්වාගෙන කාලය ගතකළේය. පසුව ඔහු පිටවීගොස් අඩහෝරාවකට පමණ පසු, එම ගොඩනැගිල්ල හිමිකාර මහතා මහමග තම මෝටර් රථයෙන් යන අතරතුර



ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ දුමක් නැගෙනු දුටු බවත්, එය පරීක්ෂා කිරීම සඳහා පැමිණි බවත් මට පැවසීය. වහාම අප දෙදෙනාම පිටත පිහිටි එළිමහන් පෙදෙසට ගියෙමු. සැනෙකින් මට මතක්වූයේ සිරිල්ගේ දුම්වැටියයි. එහි පැවති දිරාගිය ලී කැබලි කීපයක් දැවෙමින් පැවතුනි. ඔහු ඒවා නිවාදමන්නට යුහුසුළු වූ අතර, මා විශේෂ සැලකිල්ලකින් විමසිලිමත්වූයේ සිගරැට් කොටය ඇත්තේ කොහිද යන්නයි. එය දුටු වහාම එය පයින් පාගාගෙන සිට ඔහුට නොදැනෙන ලෙසින් එය ගෙන පිටතට වීසි කළෙමි. ගින්න කෙසේ සිදුවීද යන්න ඔහුට මහත් ප්‍රෙහේලිකවෙක් විය.
පසුව මා සිරිල්ට දුරකථනයෙන් කථාකර එම සිද්ධිය සැලකර ඔහුගේ දුම්වැටිය නිසා එය සිදුවූබව කී නමුත් ඔහු තම වරද නොපිළිගෙන එය මුළුමනින්ම ප්‍රතික්ෂෙප කරන ලදී.

## සිරිල්ගේ අතුරුදන්වීම

වසර ගණනාවක් ගතවූ පසු සිරිල් පිළිබඳ කිසිම තොරතුරක් නොමැති බැවින් ඔහු ඇසුරු කළ හිතවතුන් ගණනාවකගෙන්ම විමසා බැලුවෙමි. අවසානයේ සිරිල් සහ මේරි විසූ නිවස හිමිකරුගේ ජංගම දුරකථන අංකයක් මට හමුවූ අතර ඔහුට කථාකළවිට ඔහු කීවේ වසර කීපයකට පෙර ඔවුන් දෙදෙන දෙපැත්තකට වෙන්වී ගියබවය. මේරි කොළඹ දෙසට යන බස්රියකට නැංග බවත් සිරිල් අනුරාධපුර බසයකට නැංග බවත් ඉන්පසු කිසිම තොරතුරක් නොදන්නා බවත් පැවසීය. තවදුරටත් සොයාබැලීමේදී තවත් හෝඩුවාවක් ලැබුනි. මගේ හිතවතෙකුට අනුරාධපුරයේදී සිරිල් හමුවී ඇත. එම ප්‍රදේශයේ පිහිටි පෞරානික විහාරස්ථානයක වාසයකරන බවද ඔහු පවසා ඇත.

## නැවත ආපසු පැමිණීම

ඒ අනුව එම ප්‍රදේශයේ විහාරස්ථාන ගණනාවකටම දුරකථන ඇමතුම් දෙමින් සොයා බැලුවෙමි. අවසානයේ ඔහු සමග කථාකළ මම තවත් හිතවතෙක් සමග එහි ගොස් දින දෙකක් එහි ගතකළෙමි. විහාරස්ථානයෙන් දනය අඩුවක් නැතිව ලැබෙන අතර රූපවාහිනි

යන්ත්‍ර, ගුවන්විදුලි යන්ත්‍ර, ඔරලෝසු ආදිය අළුත් වැඩියා කිරීමෙන්ද ආදායමක් ලැබෙන බැවින් බණ භාවනා වලටද කාලය ගෙවමින් ඉතා සැහැල්ලුවෙන් කාලය ගෙවන බව පැවසීය. දරුවන්ගේ සිත්තුල අම්මා පෙවූ විශ කැලතෙමින් තිබුනද දරු දුක නිතර දැනෙන බවත් තවදුරටත් මා සමග පැවසීය. දරුවන් දැකීමට කැමැත්තක් ඇති නමුත් නැවත ඔවුන් වෙත යාමේ අදහසක් නැතිබවත් තවදුරටත් පැවසීය. දිනක් දුරකථනයෙන් මා ඇමතූ වැඩිමහල් දියණිය, ශ්‍රියානි තම පියා ගැන තොරතුරු විමසීය. මම සියල්ල නොවලහා කීවෙමි. ටිකදිනකට පසු සිරිල්ගෙන් දුරකථන ඇමතුක් ලැබුනි. දරු තිදෙනා තමා හමුවීමට පැමිණි බවත් තව සතියකින් පමණ ආපසු නිවසට යාමට තීරණය කළ බවත් මා සමග පැවසීය. මා සැනෙකින් එක් පැණයක් ඔහුගෙන් විමසුවෙමි.

“දරුවන් ඔයාට වැඳල සමාව ගත්තද?”

“නැහැ”

“එහෙම නම් ස්ථිර පදිංචියට යන්න එපා. සතියක් දෙකක් ගතකළ පසු අවසන් තීරණයකට බහින්න.”

තවදුරටත් අදහස් දැක්වූ මම ඒ අයට රැවටෙන්නෙ නැතිව හොඳ සිහිකල්පනාවෙන් තීරණ ගතයුතු බවත් සැලකර සිටියෙමි. ඉඩ කඩම් දේපල පවරා ගැනීමට යෙදූ උපායක් වියහැකි බව තවදුරටත් මම ප්‍රකාශ කළෙමි. කෙසේ වෙතත් සුපුරුදු පරිදි ඔහුගේ තීරණය වෙනස් කළේ නැත. බොහෝ අවස්ථා වලදී ඔහු අන් අයගේ අදහස් වලට ගරු නොකරයි. සතියකට පමණ පසු තම සියළු බඩු බාහිරාදියද රැගෙන නිවසට පැමිණි බව මට දන්වා සිටියේය.

ටික කලකට පසු තම නිවස ඇතුළු සියළු දේපල දරු තිදෙනාට පවරාදුන් අතර දෙවැන දුව පියුමි තම ස්වාමියා සමග අළුත සාදගත් නිවසෙහි පදිංචි විය. පුතා අගනුවර රැකියාවක් කරන අතර ගෙදර එන්නේ කලාතුරකිනි. ශ්‍රියානි දැන් වෛද්‍යවරියකි. එම ප්‍රදේශයේම රෝහලක සේවය කළ ඇය බොහෝවිට තම නැගනියගේ නිවසේම වාසය කළ බැවින් සිරිල් බොහෝවිට තනිවම නිවසේ කාලය ගත කරන්නට විය.



මෙසේ කලක් ගතවූවිට බාල දියණියගේ සැමියාට විදේශ රැකියාවක් ලැබීම නිසා එම යුවලම විදේශගතවිය. ඔවුන්ගේ නිවසෙහි ශ්‍රියානි ස්ථිරව පදිංචිවිය.

## දියණියගේ පහරදීම්

ශ්‍රියානි පෙම්වතෙක් සොයාගෙන විවාහ වීමට සූදනම් විය. ඔහු ගැන විස්තර සොයාබැලූ සිරිල් ඔහු විවාහක එක්දරු පියෙක් බවත් ඔහුව අමතක කරන ලෙසත් දියණියට අවවාද කළවිට ඇය කෝපාවිශ්ඨ විය.

සිරිල් දිනක් එම පෙම්වතාගේ භාර්යාව සහ දරුවා නිවසට ගෙන්වාගෙන සිටින අතර, ඒ බවක් නොහඟවා ශ්‍රියානි සහ පෙම්වතාද නිවසට ගෙන්වන ලදී. ඔවුන් මුනගැසුනවිට සියළු රහස් හෙලිවිය. නමුත් ඉන් කිපුන ශ්‍රියානි කළේ තම පියාට අතින් පයින් පහරදීමයි.

දිනක් මා සිරිල්ට දුරකථනයෙන් කථාකළවිට ඉහත සඳහන් විස්තරය මා සමග පැවසූ අතර ඔහු දෙදිනක් නිරාහාරව සිටි බවත් ආහාර කිසිවක් හෝ මුදල් කිසිත් ගෙදර නැති බවත් පැවසීය. මම වහාම තැපැල් කන්තෝරුවට ගොස් රුපියල් දහසක මුදල් ඇනවුමක් (Fax money order) යැවුවෙමි. තවත් දිනක නිරාහාරව සිටියදී ඔහුගේ ගම් ප්‍රදේශයේ සිටින හිතවතෙකුට ඒ බැව් දැන්වූවිට ඔහු අවශ්‍ය ආහාර පාන සපයා ඇත.

## දිවිනසාගැනීමට තීරණය කිරීම

තවත් දිනක ඔහු දුරකථනයෙන් මා අමතා තව දිනකින් හෝ දෙකකින් තමා දිවිනසාගැන්මට තීරණය කළබව පැවසීය. වැඩි විස්තර විමසූවිට ඔහු කියා සිටියේ පෙර දිනයේද දියණිය තමාට පහරදුන් බවය. මා ඔහුගේ සිත සන්සුන්කර වහාම එහි යාමට මගේ මෝටර් රථයෙන් පිටත් වූයෙමි.

**<u>දියණිය මෙල්ලවීම</u>**

පැය දෙකකින් පමණ එහි ළඟාවූ මම නොවරදින වැඩපිළිවෙලක් යෝජනා කළෙමි. මුලදී ඊට අකමැති වුවත් කරුණු පැහැදිලි කළවිට ඔහු ඊට එකඟ විය. ඒ අනුව ඔහුත් සමග එම ප්‍රදේශයේ පොලිස් ස්ථානයට ගොස් තම දියණියට විරුද්ධව පැමිණිල්ලක් කරන ලදී. මගේ අදහස වූයේ ඇය එම ප්‍රදේශයේම ඇති මූලික රෝහලේ වෛද්‍යවරියක් බැවින් මෙම පැමිණිල්ල ගැන ආරංචි වීම නිසා ලජ්ජාවට පත්වූවිට ඇගේ නොමනා හැසිරීම නවතින බවය. පැමිණිල්ල සටහන් කරගත් පොලිස් නිලධාරියාද එම අදහස අනුමත කළ අතර හැකි ඉක්මනින් එම ආරංචිය ප්‍රසිද්ධ කරන බවත් පැවසීය. පසුදින ලියුම් පෙට්ටිය විවෘත කළවිට රුපියල් දහක් එයතුල තිබූ බව සිරිල් මට දැන්වීය. සතියකට පමණ පසුව ඇය අවශ්‍ය ආහාරපාන සහ බේත් හේත් ආදියත් ගෙනැවිත් දෙන බවත්, දැන් සිත සැනසිල්ලේ ජීවත් වන බවත් මට දන්වන ලදී.

**<u>හදවත් සැත්කම</u>**

වසරක් දෙකක් පමණ ගතවූවිට සිරිල්ගේ හදවතේ දුර්වලතාවයක් පවතින බැවින් වැඩිකල් නොයවාම හදවත් සැත්කමක් කළයුතු බව පවසන ලදී. ඒ සඳහා තම දියණිය ශ්‍රියානි විසින් අවශ්‍ය සියළු කටයුතු සම්පාදනය කළ අතර කොළඹ මහ රෝහලට ඇතුලත්ලර එය සාර්ථකලෙස නිමාකරනලදී. ඉන්පසු වසර ගණනාවක් හොඳින් ජීවත්විය.

**<u>අවසන් ගමන</u>**

දිනක් ශ්‍රියානිගෙන් දුරකථන ඇමතුමක් ලැබුනි. තම පියා, සිරිල් හදිසි අනතුරකින් ජීවිතක්ෂයට පත්වූ බව දන්වා සිටියාය. පසුදින මම තවත් හිතවතෙක් සමග ගොස් අවමංගල උත්සවයට සහභාගි වූයෙමි. විදේශගතව සිටි බාල දියණිය පියුම් පැමිණ සිටියේ නැත.



නොමිනිස්කම් රජකරවන
මනුලොව ටික කලකට නවාතැන් ගෙන
පෙර කර්මවිපාක විඳිමින් සිටි
මනුෂ්‍ය ගුණධර්ම වලින් පරිපූර්ණ චරිතයක
අවසානය මෙසේ සිදුවිය.